**අලයාඩිවේම්පු ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමණාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අලයාඩි වේම්පු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රු. 4,950,000 ක් වටිනා වාහන 11 ක අයිතිය සභාවට පවරා තිබුණද, එම වටිනාකම ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අදාල වාහනවල වටිනාකම් දැක්විය යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. තක්සේරු කිරීම නිමවූ පසු වාහනවල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ වෙන්වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කරමි. |
| (ii) | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වාවූ කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු රු. 545,250 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | අයවිය යුතු මුදල් ගිණුම්වල පෙන්විය යුතු වේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙවැනි වැරදි සිදු නොවන පරිදි කටයුතු කරන අතර අදාල මුදල ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගිණුම්වල දක්වන බව දැනුම් දෙමි. |
| (iii) | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කරන ලද ස්ථාවර තැන්පත් වෙනුවෙන් ලැබියයුතු පොලී ආදායම් රු. 110,560 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු පොලී අදායම් ගිණුම්ගත කළ යුතු වේ. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පත් සඳහාවූ පොලී ආදායම් නිශ්චිතව දැන ගැනීමට නොහැකිවීමෙන් ගිණුම් පිළියෙල කරන අවස්ථාවේ ගිණුම්වල අතුලත් කිරීමට නොහැකි විය. ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේද අදාල පොලී ආදායම් ගිණුම්වල දක්වන බව දන්වමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.166,462,154 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළයුතු සියළුම අයිතමයන් තොරතුරු සම්පූර්ණයෙන් ලැබුණු පසු, ස්ථාවර වත්කම් ලේඛනයේ පිළියෙල කිරීමට සභාව විසින් කටයුතු යොදා ඇති අතර, සභාව සතු ඉඩම් වල ඔප්පු ලබා ගැනීමට කටයුතු කර ඇත. ඉඩම් වල ඔප්පුව ලද පසු එහි පිටපතක් ඉදිරිපත් කරමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) 5(12) වගන්තිය | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත් වල අත්සන් කිරීම්, නිලධාරින් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුණද, ඒ අයගෙන ආරක්ෂිත ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. | ආරක්ෂක ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි කාලවල නිලධාරින්ගෙන් ආරක්ෂක ඇප ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ii) 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග තත්‍ය වියදම් සමග සසදා, අතිරික්ත හා ඌනතා පිළිබද හේතු දැක්වෙන ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විචලනයන් හට අදාල පැහැදිලි කිරීම ඇතුලත් ප්‍රකාශයන් පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී පිළියෙල කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ කල් ඉකුත්වූ තැන්පත් 10 ක් සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | සභාව විසින් අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් (EPF) හා 1980 වර්ෂයේ සේවක භාරකාර අරමුදල් (ETF) පනත | EPF හා ETF අරමුදල් වලට අදාල දායක මුදල් දල වැටුප් මත ගණන් බැලිය යුතු වුවත්, අනියම් සේවකයන්ගෙන් මූලික වැටුප අනුව ගණනය කර ඇති බැවින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් EPF රු. 124,178 හා ETF රු. 18,826 අඩුවෙන් දායක මුදල් යවා තිබුණි. | පනත අනුව අරමුදලට දායක මුදල යැවිය යුතු වේ. | සභාව විසින් අගෝස්තු මාසයේ සිට සේවකයින්ගේ දළ වැටුප් මත දායක මුදල් යවනු ලැබේ. ඉදිරි කාලවලදි මෙවන් වැරදි නොවීමට වග බලා ගනිමි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | වෙනම ලේඛනයන් නඩත්තු කළ යුතු වේ. | ඉදිරියේදි පරිඝණක සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් (පොදු 287) පිළියෙල කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,566,243 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,874,998 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,000,000 | 727,030 | 501,192 | 225,838 | 250,000 | 722,161 | 722,161 | - |
| කුලී | 2,500,000 | 3,100,398 | 3,018,125 | 623,591 | 1,990,000 | 2,072,814 | 2,137,874 | 541,318 |
| බලපත්‍ර ගාස්තු | 900,000 | 652,330 | 652,330 | 16,680 | 805,000 | 671,877 | 671,877 | 16,680 |
| වෙනත් ආදායම් | 14,541,000 | 9,121,158 | 4,535,808 | 4,585,350 | 13,381,000 | 11,803,112 | 11,803,112 | - |

**2.2.2** බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි සහා බලප්‍රදේශයේ සිනමා ශාලාවක් නොතාරිස් කාර්යාලයක් සහ රථ ගාලක් 2018 වර්ෂයේ ව්‍යාපාර කටයුතුවල යෙදි තිබුණ ද, ප්‍රාදේශීය සභා පනතේ 150(1) අනුව බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙවැනි වැරදි නොවීමට වග බලාගන්නා අතර බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන්ම අයකිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

**2.2.3** උසාවි දඩ සහ මුද්දර ගාස්තු

**(අ)** උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල හිඟ මුදල වශයෙන් රු. 1,995,402 ක් සමාලෝචිත වර්ෂයේදි ලැබි තිබුණි. 2018 වර්ෂය අවසාන දක්වාවූ උසාවි දඩ මුදල් ගෙන්වා ගැනීමට 2019 මැයි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | අදාල කාල පරිච්ඡේදයතුල දඩ මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදල අදාල කාල පරිච්ඡේදයේදීම ලබා ගැනීමට තිබෙන බාධාවන් සොයා ඒ අනුව කටයුතු කර ලිඛිත සිහිකැඳවීම් යවා උසාවි දඩ මුදල කඩිනමින් ලබා ගැනීම සඳහා සභාව ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |

**(ආ)** මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ තිබෙන නිශ්චල දෙපල මාරුකිරීමේදි නැගෙනහිර පළාත් ආදායම් දෙපාර්තුමේන්තුවෙන් 2017 සහ 2018 වර්ෂවල ඍජුව සහ ජංගම සේවය මගින් අයකරගත් අතිරේක මුද්දර ගාස්තු ගණනය කර අයකරගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු අයකර ගෙන ඇත. 2018 දෙසැම්බර් මාස දක්වා මුද්දර ගාස්තු ගණනය කර නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් - මුදල් කාර්යාලයට යැවීමට සභාව විසින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුභ විචරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින දක්වා කරුණු 14 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර නොතිබුණි. | පනත අනුව අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 05 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ යුතු වේ. | පිළිතුරු එවා නොතිබුණි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2016 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කන්නගි පුරම්හි කසල එකතු කර කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කිරීම සඳහා ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ මධ්‍යස්ථානය රු. 1,253,940 ක වියදමින් ඉදිකර තිබුණි. තවද, 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු. 1,210,000 ක් වටිනා යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණි. 2018 මැයි 28 වන දින දක්වා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය සාක්‍යතා අධ්‍යනය සහ සැලැසුම් සකස්කර නොතිබීමෙන් 2018 වර්ෂයේදී රු. 709,842 ක් මුදලක් ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභාව වෙත | අදාල ඝණ අපද්‍රව්‍ය ඉවත් කරන මධ්‍යස්ථානය නැවත ක්‍රියාත්මක කර මිලදි ගන්නා ලද යන්ත්‍ර 02 සවිකිරීමට කටයුතු කර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු | මහජනයා සමඟ සාකච්ඡා කර සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර අදාල සන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන නැවත ක්‍රියාත්මක කිරීමට හා මිලදි ගෙන ඇති යන්ත්‍ර 02 සවිකිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | |
|---|---|---|
| ගෙවා තිබුණි. | කළ යුතු වේ. | |

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළයුතුයි. කෙසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලබා කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක අනුව 2030 වර්ෂය දක්වා සංවර්ධන ඉලක්ක කර සැලසුම් සකස්කරන බව දැනුම් දෙමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහජන පුස්තකාලාධිපති විසින් 2017 සැප්තැම්බර් 15 වන දින පුස්තකාලයේ අළුත්වැඩියා කටයුතු කළ යුතු බව දන්වා තිබුනද, සමාලෝචිත වර්ෂයේදීද අළුත්වැඩියා කර නොතිබීමෙන් පුස්තකාලයේ කැඩී තිබූ වහලෙන් වැහි වතුර වැටී පරවි මල සමඟ මිශ්‍රවීමෙන් එම ප්‍රදේශය අපිරිසිදු වීමෙන් පුස්තකාලයේ තිබූ වටිනා දුර්ලභ ගණයේ පොත් කීපයක් විනාශ වී ඇති අතර 2018 මාර්තු 24 දින සිට එම කොටස භාවිතයෙන් තොරව තිබුණි. | පුස්තකාලයේ අළුත්වැඩියාව කඩිනමින් කර පුස්තකාල පොත් ආරක්ෂා කිරීමට සහ පාඨකයින්ට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම මහජන පුස්තකාලයේ අළුත්වැඩියා කඩිනමින් නිමකර පොත්පත් ආරක්ෂා කිරීමට සහ පාඨකයින්ට ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |
| (ආ) | 2017 වර්ෂය වෙනුවෙන් පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශයන් අනුව පසුවිපරම් කටයුතු කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අදාල පසු විපරම් කටයුතු අදාල කාලවලදී කළ යුතු වේ. | 2017 වර්ෂයේදී හානි වී ඇති බව සඳහන් කර තිබූ පොත් 75 2018 භාණ්ඩ සමීක්ෂණයේදී ඇතුලත් කර පසු විපරම් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ජල සම්බන්ධතා ලබා ගැනීමේදි අදාල මාර්ග නැවත සකස්කිරීම සඳහා පදිංචිකරුවන් 114 දෙනාගෙන් 2018 වර්ෂයේදී රු. 233,100 ක් අයකර ගන්නා ලද පාර නැවත සකස්කර නොතිබුණි. | හාරන ලද මාර්ග නැවත සකස්කළ යුතු වේ. | මින් ඉදිරියේ මෙසේ හාරන ලද වලවල් කාර්තුවකට හෝ කාර්තු දෙකකට වරක් නැවත සකස්කිරීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ තනතුරු වර්ග 08 ක පැවති පුරප්පාඩු 08 ක් සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ තිබෙන පුරප්පාඩු 08 පිරවීම සඳහා කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාල දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර තනතුරු පුරප්පාඩු පිරවීමට ක්‍රියා කරන බව දන්වා සිටිමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ යම් සංචල නොවන දේපළ හඳුනාගෙන වරිපනම් බදු පැනවිය හැක. කෙසේ වුවද, සභාව ඉහත පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා සභා බල ප්‍රදේශයේ තිබෙන නිවාස 4821 සහ කඩ කාමර 663 කින් වරිපනම්බදු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභා බලප්‍රදේශයේ සංවර්ධන වූ ප්‍රදේශ හඳුනාගෙන එම ප්‍රදේශ වලින් වරිපනම් බදු අයකර ගැනීමෙන් සභාවේ ආදායම් වැඩිකර ගත යුතු වේ. | මේ සම්බන්ධයෙන් දැනට තිබෙන සභාව සමඟ සාකච්චා කර තීරණයක් ලබා ගෙන අනාගතයේ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් ගොඩනැගිලි වල වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 158,905,253 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද, සංචල සහ සංචල නොවන වත්කම් ලේඛනයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයන් පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් වෙන්වෙන් වශයෙන් සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.5.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු වාහන 07 ක් වසර 04 කට වඩා වැඩි කාලයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර සභාවට අයත් ස්ථානවල ගාල්කර තිබුණි. | වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල වාහන කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |

### 3.6 ප්‍රසම්පාදන

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂවලදී අදාල වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනු ලැබේ. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන 3.9.1 කොන්දේසි අනුව ලබා දෙන ලද කොන්ත්‍රාත් වැඩ කොන්ත්‍රාත්කරු විසින් උප කොන්ත්‍රාත් ලබාදිය නොහැක. කෙසේවූවද, වෙනත් අයෙකුට කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශනය අනුව උප කොන්ත්‍රාත් ලබා දිය නොහැක. | ඉදිරියේදී උප කොන්ත්‍රාත් ලබා දීම සඳහා සම්පූර්ණයෙන් අවසර නොදෙන බව දැනුම් දෙමි. |